මාන්තෙයි බටහිර ප්‍රාදේශිය සභාව

මන්නාරම දිස්ත්‍රික්කය.

-----------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

---------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 මාර්තු 28 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 28 දින ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 24 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

1.2 මතය

---------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ සඳහන් කරුණු වලින් මූල්‍ය ප්‍රකාශයන්ට වන බලපෑම හැර 2013 දෙසැම්බර් 31 දින මාන්තෙයි බටහිර ප්‍රාදේශීය සභාවේ වැඩකටයුතු වල තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් වල ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදු සම්මත ගිණුම්කරණ මූලධර්මයන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.3. මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනාවරණය කර නොතිබුණි.

(ආ) අදාළ වැඩ නිම කර තිබුණු නමුත් එකතුව රු. 176,370 ක් වූ විවිධ තැන්පතු නිරවුල් නොකළ තැන්පතු ලෙස දක්වා තිබුණි.

1.3.2. අනුකූල නොවීම්

----------------------

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවූ පහත සඳහන් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති,රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම |
| --- | --- | --- |
| (අ) ප්‍රාදේශීය සභා (මූල්‍ය සහ පරිපාලන) රීති - 1988 | | |
| i. රීති අංක 5(xii) | - | මුදල් ගබඩා ආදිය පිළිබඳව කටයුතු කරන නිලධාරීන්ගෙන් ප්‍රමාණවත් ආරක්ෂක තැන්පතු ලබාගෙන නොතිබුණි. |
| ii. රීති අංක 59 | - | ආදායම් රැස් කිරීම අරමුණු කරගෙන ව්‍යාපාර ආයතන පිළිබඳ ලැයිස්තුවක් සකස් කළ හැකි වනු පිණිස ආදායම් නිලධාරීන් හෝ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරීයෙකු විසින් වර්ෂය ආරම්භයේදි සභා ප්‍රදේශය තුල වූ ව්‍යාපාර ආයතන පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| iii. රීති අංක 76 | - | රු.957,327 ක් වූ කඩ බදු කුලී අයකර ගැනීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි. |
| iv. රීති අංක 216 | - | සභාපතිවරයා විසින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් හෝ ඉඩම් සහ ගොඩනැගිලි පරීක්ෂා කර නොතිබුණි. |
| (ආ) අංක IAI/2002/02 සහ 2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය | - | පරිගණක සහ උපාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | අංක 41/90 සහ 1990 ඔක්තෝබර් 10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | මාස 06 කට වරක් සභාවේ වාහන වල ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කර නොතිබුණි. |
| (ඈ) | 1988 අංක 86 දරන පණතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පණත | - | පාරිසරික බලපත්‍ර නිකුත් කිරීමට පළාත් පාලන ආයතනයන්ට බලය පවරා තිබුණි. නමුත් සභාව විසින් ගවමස් කඩ 9 කට එවැනි බලපත්‍ර නිකුත් කර නොතිබුණු අතර ඒ හේතුවෙන් සභාවට ආදායම් අහිමි වී තිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>------------------------------------<br>මුදල් රෙගුලාසි 570 | - | එකතුව රු.26,966,638 ක් වූ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | ආයතන සංග්‍රහය<br>----------------------<br>xxiv පරිච්ඡේදයේ 4 වගන්තිය | - | නිලධාරීන් 4 දෙනෙකුගෙන් රු.87,150 ක් වූ වැටුප් අත්තිකාරම් හිඟය අයකර ගැනීම පිණිස 2013 දෙසැම්බර් 31 දක්වා කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය පාලනය

------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.6,871,256 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.3,489,957 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහතදැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| බදුකුලී | 2,959,400 | 2,519,340 | 957,327 |
| බලපත්‍ර ගාස්තු | 550,750 | 370,890 | - |
| සේවා ගාස්තු | 6,280,420 | 5,637,722 | 209,180 |
| වරෙන්තු ගාස්තු, දඩ සහ අධිභාර | 1,500,000 | 2,820,730 | 7,110,445 |
| වෙනත් | 1,435,000 | 1,751,226 | - |
| එකතුව | 12,725,570 | 13,099,908 | 8,776,952 |

### 2.2.2 හිඟ කුලී

කඩ කාමර 12 ක හිඟ කුලී සහ ටෙන්ඩර් තැන්පතු මුදල වු රු.957,327 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

### 2.2.3 මුද්දර ගාස්තු

2013 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු රු.695,195 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

2.2.4. අභ්‍යන්තර විගණනය

-------------------------

සභාව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති සහ පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම්

(ඈ) වත්කම්

(ඉ) කොන්ත්‍රාත්තු